ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව- 03 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2021/2022

සාධාරණත්වයේ මූලධර්ම - LLU3502/LWU1202

කාලය- පැය තුන (03) යි.

දිනය: 2023 ජනවාරි 23 වේලාව: පෙ.ව. 9.30 - ප.ව.12.30

මුළු ප්‍රශ්න ගණන - 08

**I කොටසින් ප්‍රශ්න <u>එකක්</u> හා II කොටසින් ප්‍රශ්න <u>හතරක්</u> ද ඇතුළුව ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**විභාග අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

**<u>I කොටස - සාධාරණත්වයේ මූලධර්ම</u>**

**<u>මෙම කොටසින් එක් ප්‍රශ්නයකට (01) පමණක් පිළිතුරු සපයන්න.</u>**

01. සාධාරණත්වයේ ඓතිහාසික පරිණාමය සහ එහි වර්තමාන ප්‍රවනතා ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රකාශය සම්බන්ධව අදහස් දක්වන්න.

"අයිතිවාසිකම්, විශේෂයෙන් දේපළ අයිතිවාසිකම් නිශ්චය කිරීමේදී වරදින සුළු වූ ද, සර්වඥ නොවූ ද,මනුෂ්‍යයන් විසින් අත්කරගත හැකි එකම යුක්තිය නීතියට අනුකූල වන යුක්තිය බව මට පැහැදිලි වෙයි. ඒ වනාහි නිසැක හා බේරුම් කොට ඇති සිද්ධාන්ත අදාල කිරීමේ සිට ඔප්පු කොට ඇති හෝ පිළිගත් කරුණු දක්වා නික්මෙන යුක්තියයි. එබැවින් සාධාරණත්ව ක්ෂේත්‍රයෙහිද චාන්සලර්වරයාගේ පාදවල ප්‍රමාණය දැනගෙන ඇත; නො එසේ නම්,මැනීමෙන් එය දැන ගත හැකිය. සාධාරණත්වය ප්‍රතිඵල ඇතිවෙන තත්ත්වය පසුකොට ඇතිබව මෙයින් අදහස් නොවෙන අතර,මෙහි සරල අදහස නම්,සිද්ධාන්ත වලින් හටගත් පූර්ව නිදර්ශන අනුව පැවතෙන්නක් නීත්‍යානුකූල විය යුතු බවය. මෙය මෙලෙස විය යුතු බව යෙහෙකි. නො එසේ නම්,ස්වකීය සේවදායකයාගේ අයිතිය පිළිබඳව ඔහුට නිර්භයව උපදෙස් දීමට කිසිම නීතිඥයෙකුට නොකළ හැකි වන අතර,සෑම දබරයක්ම නඩුවකට මඟ පැදෙනු ඇත. "

*Cowcher V. Cowcher* (1972) 1All ER 943 at 948

(ලකුණු 20)

02. "සාධාරණත්වයේ ආප්ත සාධරණත්ව නීතී වශයෙන් නොව නඩු තීන්දු ප්‍රකාශයට පත් කරන විට චාන්සරි අධිකරණය කෙරෙහි බලපෑ මාර්ගෝපදේශ වශයෙන් සැලකිය යුතුය."

ඉහත ප්‍රකාශය පිළිබඳ අදහස් දක්වන්න. (ලකුණු 20)

## <u>II කොටස - භාර නීතිය</u>

**<u>මෙම කොටසින් ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.</u>**

03. තම දොළොස් හැවිරිදි දියණිය වන මිහිරිගේ යහපත වෙනුවෙන් භාරයක් පිහිටුවීමට කවිදු අදහස් කරයි. පහත සඳහන් අවස්ථාවන්හි නෛතිකභාවය සලකා බලන්න.

(අ) භාරකරු ලෙස දාහතර හැවිරිදි පුතා පත් කිරීම.

(ආ) නොතාරිස් පැවරුම්කරයකට එළැඹීම සඳහා වියදම් අධික බැවින් නොතාරිස් පැවරුම්කරයකින් තොරව ඔහුට හිමි රබර් වත්ත පිළිබඳ භාර ඔප්පුවක් ඇති කිරීම.

(ඇ) මිහිරිගේ අධ්‍යාපන කටයුතු සඳහා පහසුකම් සැලසීමේ අරමුණින් ඔහුගේ බැංකු තැන්පතුවලින් වැඩි කොටසක් වෙන් කිරීම.

(ඈ) මිහිරිගේ, දරු මුණුබුරන්ගේ යහපත සඳහා රු. මිලියන 10ක මුදලක් ඔහුගේ සහෝදරයා වෙන සමීරට ලබාදීම.

භාර ආඥා පනතේ අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ උචිත නඩු තීන්දු මඟින් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

(එකකට ලකුණු 05බැගින්)
(05×04 = ලකුණු 20)

04. "ඉංග්‍රීසි නීතිය සහ ශ්‍රී ලංකා නීතිය අනුව පුණ්‍ය කටයුතු වලට දීම යන්නෙහි නෛතික අර්ථය මූලික වශයෙන් සමාන වුවද, පොදු ජන යහපත නැමති පැතිකඩ සම්බන්ධයේදී අප නීතිය වඩා පුළුල් බව පැහැදිලි වේ. ශ්‍රී ලංකාවේ කුඩා ප්‍රජාවකට අයිති පුද්ගලයන් එංගලන්තයේ එලෙස සැලකිය හැකි පුද්ගලයන්ට වඩා පුණ්‍ය භාරයක අර්ථලාභීන් වීමට සුදුසු අයවලුන් ලෙස සැලකීමට ශ්‍රී ලංකාවේ අධිකරණ කැමැත්ත පළකොට තිබේ."

අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු නීතිය උපයෝගී කර ගනිමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න. (ලකුණු 20)

05. හික්කඩුව ප්‍රදේශයේ හෝටලයක් හිමි පසිඳු හට පුතෙක් සිටියි. පසිඳු වෛද්‍ය පරීක්ෂණයක් සඳහා ඔහුගේ වෛද්‍යවරයා වෙත ගිය අවස්ථාවේදී, මත්පැන් පානය කිරීම නිසා ඔහුගේ අක්මාවට දැඩි බලපෑමක් එල්ල වී ඇති බව වෛද්‍යවරයා ඔහුට පැවසීය. වෛද්‍ය පරීක්ෂණය සහ මරණයට පත්වේය යන බිය නිසා පසිඳු තම හෝටලය සිය සොහොයුරා වන රවිඳුට පවරන ලදී. සතියකට පසු, වෛද්‍යවරයා පසිඳුට දුරකතන ඇමතුමක් ලබාදෙමින් වෙනත් රෝගියෙකුගේ වෛද්‍ය වාර්තා සමග පසිඳුගේ වෛද්‍ය වාර්තා මාරුවීම පිළිබඳ සමාව අයැද සිටියේය. ඉන්පසුව, නැවත තමාට හෝටලය පවරන ලෙස පසිඳු රවිඳුගෙන් ඉල්ලා සිටිනු ලැබුවත් පසිඳුට හෝටලය නැවත පවරාදීම රවිඳු ප්‍රතික්ෂේප කරයි.

(අ) භාර ආඥාපනතේ ප්‍රතිපාදන සහ නඩු නීතිය ඇසුරු කර ගනිමින් පසිඳුට උපදෙස් ලබාදෙන්න. (ලකුණු 12)

(ආ) පසිඳු විසින් මෙම හෝටලය, රවිඳු වෙනුවට ඔහුගේ පුත්‍රයාට පවරා තිබුනේ නම් ඔබගේ පිළිතුරෙහි වෙනසක් වේද? ඔබේ පිළිතුර සඳහා හේතු දක්වන්න. (ලකුණු 08)

06. "1917 අංක 09 දරන භාර ආඥා පනතේ 02 වෙනි වගන්තිය 'අත්හැරුණු කරුණක්' සම්බන්ධයෙන් ඉංග්‍රීසි නීති මූලධර්ම යොදා ගැනීමට ඉඩ ලබාදෙනු ලැබේ. එවැනි තත්ත්වයක් තුළදී, ඉංග්‍රීසි නීතිය හුදු ඒත්තු ගන්වන සුළු නොව අනුගම්‍ය හෙවත් බැඳෙන සුළු භාවයකින් යුක්ත වන බව මතක තබා ගත යුතුය. 1917 අංක 09 දරන භාර ආඥා පනතේ කිසිම විධිවිධානයක් අදාල නොවෙන බව නියත වශයෙන්ම සහතික නොවී කිසිවෙකු විසින් භාර ආඥා පනතේ මෙම 02 වගන්තියේ පිහිට නොපැතිය යුතුය. "

ඉහත ප්‍රකාශය විවේචනාත්මකව පැහැදිලි කරන්න. (ලකුණු 20)

07. පියල්, නුවරඑළියේ පිහිටි තමාගේ අක්කර 40ක් වූ තේ වත්තේ සහ හෝටලයේ භාරකරු ලෙස අමල්ව පත් කලේය. ඔහුගේ දියණියන් වන විමලි සහ කමලි වයෝපූර්ණත්වයට පත්වන තෙක් එම දේපල රැක බලාගන්නා මෙන් උපදෙස් දුන් අතර පිළිවෙලින් විමලි සහ කමලි දොළොස් වියට සහ දහසය වෙනි වියට එළඹෙත්ම පියල් මිය ගියේය. මසකට දෙවතාවක් නුවරඑළියේ පිහිටි තේ වත්ත බැලීමට යාම සඳහා එක් ගමන් වාරයකට රුපියල් 30000ක් බැගින් වූ මෝටර් රථයක් අමල් විසින් කුලියට ගන්නා ලදී. අමල්, නුවරඑළිය බලා දුම්රියෙන් ගියේ නම් ඔහුට වැය වෙන්නේ රුපියල් 2500ක් පමණි. විමලි, ඇගේ වයස අවුරුදු 18 සම්පූර්ණවත්ම, හෝටලය විකුණා ඇයට හිමි කොටස ලබා දෙන ලෙස අමල්ගෙන් ඉල්ලා සිටියාය. ඒ අතරතුර, තේ වත්තට අයත් අක්කර 05ක ප්‍රමාණයක් රුපියල් මිලියන 3කට අමල් විසින් බිමල්ට විකුණුවේය. එහි වෙළඳ පොළ වටිනාකම රුපියල් මිලියන 5ක් බව ගණන් බලා ඇත. ඉඩම විකිණීම සම්බන්ධව විමලි දැන සිටියත් එය වැළැක්වීමට ඇය කිසිදු පියවරක් නොගත්තාය. විමලිට සහ

කමලිට අයත් දේපල පැවරීමට අදාලව අමල් විසින් නීතිඥවරයකුගෙන් උපදෙස් ලබාගත් අතර උපදේශන ගාස්තු සඳහා රුපියල් 15000ක මුදලක් අමල් විසින් ඔහුගේ මුදලින් ගෙවා ඇත. කමලි මෙම තීරණ සහ ගණුදෙනු සම්බන්ධයෙන් දැනගත් විට, ඇය ඔබගෙන් උපදෙස් අපේක්ෂා කරයි.

භාර ආඥා පනතේ විධිවිධාන ඇසුරින් කමලිට උපදෙස් ලබා දෙන්න. (ලකුණු 20)

08. පහත සඳහන් ඕනෑම <u>දෙකක්</u> **<u>(02)</u>** පිළිබඳ සටහන් ලියන්න.

(අ) 2018 අංක 6 දරන භාර (සංශෝධන) පනත

(ආ) භාරයන්හි සදාකාලිකත්වයට එරෙහි රීතිය

(ඇ) සාධාරණත්වයේ ප්‍රතිකර්මයක් ලෙස එලෙසින්ම ඉටුකිරීම

(එකකට ලකුණු 10 බැගින්)

(10×02 = ලකුණු 20)

**-හිමිකම් ඇවිරිණි -**